# පටුන


පිටු අංකය

1. කොටස

1.1. 2024 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීමේ ප්‍රසම්පාදන කොන්දේසි 3- 6

1.2. ආරක්ෂක සේවා යෙදවුම් උපලේඛනය 7

2. කොටස

2.1. ලංසු ආකෘති පත්‍රය 8-9

3. කොටස

3.1. පිරිවැය වාර්තාව 10-11

3.2. මාසික වේතනයේ ප්‍රමාණය 11

3.3. ලංසු අයදුම්කරුගේ ප්‍රකාශය 12-15

3.4. ලංසු සුරක්ෂණ සහතිකය සඳහා ආකෘතිය 16

4. කොටස

4.1. කොන්ත්‍රාත් ගිවිසුම 17-23

4.2. කාර්ය සාධන සුරක්ෂණය සඳහා පිළිගත් ආකෘතිය 24


INSPECTION ONLY

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

**ලංසු ආරාධනය**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීමට සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් අංකය: DIE/PRO/03/2023/58**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වැලිසර රඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.
3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට වැඩිමනත් විස්තර බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය",හි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 5 වන මහලේ "බී" පර්යන්තයේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර එම ලිපිනයේදීම ලංසු ලිපිලේඛන පරීක්ෂාව 2024.01.03 දින සිට 2024.01.22 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයක දී පෙ.ව. 9.00 සිට පස්වරු 3.00 දක්වා සිදු කළ හැක.
   ඇමතුම් අංක : දුරකථන 011 2101559 ෆැක්ස් අංක - 011-2879091
4. රුපියල් පන්දහසක (රු.5,000.00) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වෙනි මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2024.01.03 දින සිට 2024.01.22 දක්වා කාල පරිච්ඡේදයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිල දී ගත හැක.
5. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2024.01.23 වැනි දින ප.ව.2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේ දී පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කරන ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර එම ලංසු විවෘත නොකර ආපසු භාරදීම සිදු කරනු ලැබේ.
6. ලංසුකරු විසින් භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින 91 කාල සීමාවකට හෝ ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.
7. සියලුම ලංසු, ලංසු ලේඛනයේ 3.4හි දක්වා ඇති ආකෘතියේ පරිදි ලංසු සුරක්ෂණයක් සමඟ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත (ලිපිනයට) එවිය යුතු අතර ලංසු සුරක්ෂණය රු. 250,000.00 ක වටිනාකමකින් යුතු 2024.05.05 දින තෙක් වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.
8. පූර්ව ලංසු රැස්වීම 2024.01.12 වැනි දින ප.ව. 2.00 ට "සුහුරුපායෙහි" 5 වන මහලෙහි පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ දී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

INSPECTION ONLY

# 1 කොටස

## 1.1 ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් කඳවුර සඳහා 2024 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීම

### ප්‍රසම්පාදන කොන්දේසි

1. 2024 වර්ෂය වෙනුවෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම සඳහා **2024.01.22** දින ප.ව. 2.00 දක්වා සුදුසුකම් ලත් ආයතන වලින් ලංසු කැඳවනු ලැබේ.

2. මෙම කාර්යය සඳහා අයදුම් කරන ආයතන පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
   - I. සියළුම පෞද්ගලික ආරක්ෂක ව්‍යාපාර/ආයතන, 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.
   - II. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අනිවාර්යෙන්ම ලංසු පත් සමඟ ඉදිරිපත් කළ යුතු අතර ඔබ ආයතනය ආරක්ෂක සේවාව සැපයීම සඳහා තෝරාගනු ලැබුවහොත් **2024** වසරට අලුත් කරන ලද වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.
   - III. ආදායම් බදු ගෙවන බව සනාථ කරන ලේඛන (පසුගිය වර්ෂ 03 සඳහා) සහ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.
   - IV. කාන්තා ආරක්ෂක නිලධාරීන් සහ පිරිමි ආරක්ෂක නිලධාරීන් වශයෙන් දිවා, රාත්‍රී සේවයේ යෙදිය හැකි නිලධාරීන් පිරිසකගේ සේවය සැපයිය යුතුවේ.
   - V. ආරක්ෂක සේවාව සඳහා යොදන නිලධාරීන් හා සේවකයන් වයස අවු. 18 ට වඩා නොඅඩු විය යුතු අතර 50 ට වඩා නොවැඩි විය යුතු අතර මනා සෞඛ්‍යයෙන් හෙබිවූ අය විය යුතුය.
   - VI. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන්ගෙන් හා පොලිසියේ සේවයෙන් නීත්‍යානුකූල නොවන පරිදි හැරගිය පුද්ගලයන් සේවයේ යොදවා නොමැති බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.
   - VII. පසුගිය වසර පහක කාලය තුල දී ඔබ විසින් ආරක්ෂක සේවය සපයන ලද රජයේ හෝ පෞද්ගලික ආයතනවල දුරකථන අංකයන් හා ලිපිනයන් ද සඳහන් ලැයිස්තුවක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.
   - VIII. පසුගිය ආසන්න වසර දෙකකදී සේවා සැපයූ ආයතනවලින් සේවා ඇගයීම පිළිබඳ සහතික ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.
   - IX. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ඔබගේ සේවය සැපයිය යුතු වේ. සේවා මුරයක් පැය 12ක් වන අතර දිවා හා රාත්‍රී සේවා මුර සඳහා පිරිමි හා කාන්තා ආරක්ෂක නිලධාරින් පෙ.ව. 7.00 සිට ප.ව. 7.00 හා ප.ව. 7.00 සිට පෙ.ව. 7.00 ලෙස සේවයේ යෙදවිය යුතු ය.
   - X. දෙවන කොටස පිරිවැය වාර්තාව සම්පූර්ණ කිරීමේදී එක් එක් කාණ්ඩ යටතේ සඳහන් කර ඇති නිර්නායකයන්ට (වැඩකල යුතු දවස් හා පැය ගණන්) අනුව දැරිය යුතුවන ව්‍යවස්ථාපිත වැටුප්, දීමනා, අමතර ගෙවීම්, දායක මුදල් (EPF, ETF) නිසි පරිදි ඇතුලත් කල යුතුය.
   - XI. ආගමන හා විගමන පාලක ජනරාල් ඉල්ලා සිටියහොත් ආරක්ෂක සේවයේ නියුතු සේවකයින් හා පරීක්ෂක නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතික හෝ පොලිස් නිෂ්කාශන සහතික ඉදිරිපත් කිරීමට සේවාව සපයනු ලබන ආයතනය සූදානමින් සිටිය යුතුය.
   - XII. ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් අදාළ මිල ගණන් ලංසු ලේඛන කට්ටලයෙහි 3.1 පරිදි ඉදිරිපත් කළ යුතු අතර ආරක්ෂක නිලධාරීන් වෙත සිදු කරනු ලබන ගෙවීම් පිළිබඳ තොරතුරු 3.2හි පරිදි සඳහන් කළ යුතුය.
   - XIII. තෝරා ගනු ලබන ආරක්ෂක සේවා සැපයුම් ආයතනයේ සියළුම කාන්තා සහ පිරිමි නිලධාරීන්/සේවකයින් විනය ගරුක විය යුතු අතර ආගමන හා විගමන දෙපාර්තමේන්තු

INSPECTION ONLY

නිලධාරීන්ට/සේවකයින්ට, ආචාරශීලී විය යුතුයි. කිසියම් පැමිණිල්ලක් ලැබුණහොත් ඒ පිළිබඳව පරීක්ෂා කොට එම ආරක්ෂක නිලධාරීන්/ සේවකයින් ඉදිරි කාලයේ දී රාජකාරියේ නොයොදවන ලෙස උපදෙස් දීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය තිබේ. ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදී සිටීම පිළිබඳව ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පැමිණ පරීක්ෂා කර මාසික වාර්තාවක් දෙපාර්තමේන්තුවේ පාලන අංශයට ඉදිරිපත් කළ යුතු වේ.

XIV. ආරක්ෂක නිලධාරීන් විසින් භාවිත කරනු ලබන ආයුධ හා ඒවා පරිහරණය කිරීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශයේ නිසි අවසරයක් ලබා තිබිය යුතු අතර,එය තහවුරු කිරීමට අදාළ ලේඛණ ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම, ආයතනය සතු ගිනි අවි සම්බන්ධ විස්තර(ගිනි අවි අංකය හා වර්ගය),ගිනි අවි භාවිතයට ලබා ඇති අවසරපත(ආයතන/පෞද්ගලිකව) හා එහි වලංගුතාවය, ආරක්ෂක නිලධාරීන් ගිනි අවි භාවිතයට ලබා ඇති පුහුණුව හා පලපුරුද්ද සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුය.

XV. ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මඟින් තීරණය කරන ලදුව දැනට ක්‍රියාත්මක වන අවම වැටුපට අඩු නොවන වැටුපක් සේවකයන් වෙත ගෙවූ බව සනාථ කිරීම සඳහා ආයතනය පිහිටි ප්‍රදේශයේ කම්කරු කාර්යාලයේ ප්‍රධානියා විසින් සහතික කරනු ලැබූ වැටුප් ලේඛනවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

XVI. මිල ගණන් ඉදිරිපත් කරන දිනට ආසන්න වර්ෂයක කාල සීමාව තුළ දී සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් ගෙවූ බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් සහතික කරන ලද “C” වාර්තා, බැංකු රිසිට්පත් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් සහතික කරන ලද ප්‍රේෂණ නිවේදන ආකෘති R-1 වාර්තා පසුගිය මාස 3 කට අදාලව ඉදිරිපත් කළ යුතුය.

XVII. සේවය සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව රජය මඟින් සේවකයන් සඳහා කිසියම් වැටුප් හෝ දීමනා වැඩි කිරීමක් සිදු කළහොත් එසේ වැඩි කරන ලද වැටුප් හෝ දීමනා සේවකයන් සඳහා අනිවාර්යයෙන් ම ගෙවිය යුතු වේ. තවද පැය 9 ක රාජකාරී කාලයෙන් පසුව රාජකාරී කරනු ලබන සෑම පැයක් සඳහාම අතිකාල දීමනා ගෙවිය යුතු වේ.

XVIII. මිල ගණන් ඇගයීමේ දී 1941 අංක 27 දරන පනත හා ආරක්ෂක සේවා පඩිපාලක සභා තීරණය අනුව දැනට ක්‍රියාත්මක අවම වැටුපට අඩු නොවන වැටුපක් සේවකයන් සඳහා ගෙවනු ලබන ආයතනයන්හි මිල ගණන් පමණක් සළකා බැලීමට කටයුතු කරන අතර එයට අඩු මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනයන් අගැයීම් ක්‍රියාවලියෙන් ඉවත් කරන බව ද මෙමගින් අවධාරණය කරනු ලැබේ.

XIX. කොන්ත්‍රාත්තුව අවසාන කිරීම.

- පහත දැක්වෙන කරුණු හා ආයතනයේ ආරක්ෂාවට අයහපත් ලෙස බලපාන වෙනත් කරුණක් අනුව කොන්ත්‍රාත්තුව කඩ කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුව පැහැර හැරීමේ නිවේදනය ලිඛිතව අයදුම්කරු වෙතට යැවීමටත්, කොන්ත්‍රාත්තුව මුළුමනින් හෝ එහි කොටසක් වශයෙන් අවසන් කිරීමටත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය තිබේ.
    - රැඳවියන් අත්අඩංගුවෙන් පලායාම.
    - ආරක්ෂක සේවාවට අයත් නොවන පුද්ගලයින් රඳවා තබා ගැනීම හා එවැනි පුද්ගලයින්ට නවාතැන් පහසුකම් සැපයීම.
    - පැමිණීම හා පිටවීම සටහන් කිරීම පැමිණීමේ අත්සන් ලේඛණයේ අත්සන් නොකිරීම.
    - ව්‍යවස්ථාපිත වැටුප්, දීමනා, අමතර ගෙවීම්, දායක මුදල් (EPF, ETF) වාර්තා මාසිකව ඉදිරිපත් නොකිරීම.
    - දෙපාර්තමේන්තුවේ නිසි අවසරයකින් තොරව රැඳවියන් පිටතට රැගෙන යාම.
    - රැඳවියන් හට අවසර ලබාදුන් භාණ්ඩ හා සේවා හැර වෙනත් සේවා හා භාණ්ඩ ලබාදීම හා එසේ කිරීමට ආධාර හා උපකාර ලබාදීම.
    - භූමිය තුල අනවසර පුද්ගලයන් සිටීම.

INSPECTION ONLY

- ව්‍යාජ අත්සන් යෙදීම.
- කොන්ත්‍රාත්තුව මඟින් නියම කරන ලද ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව සේවයේ නොයෙදීම.
- කොන්ත්‍රාත් ගිවිසුමෙන් එකඟ වූ කාර්යයන් නිසි ලෙස ඉටු නොකිරීම.
- ආයතනයේ දේපල වලට හානි කිරීම.
- මත්පැන් හෝ විෂ මත්ද්‍රව්‍ය පානය කර රාජකාරියෙහි යෙදීම.
- ආරක්ෂක සේවයේ යෙදෙන සේවකයින් ආයතනයේ කාර්යමණ්ඩලය හා රැඳවියන් සමඟ අනවශ්‍ය ගැටුම් ඇතිකර ගැනීම.
- පුද්ගල ජාවාරමට හෝ පුද්ගල වෙළෙඳාමට නීතියෙන් වරදකරු වූ පුද්ගලයෙකු ආරක්ෂක සේවය තුළ නිරතව සිටීම.
- භූමිය තුළට පැමිණෙන සහ භූමියෙන් පිටත්වන අයගේ ගමන්මළු සහ පාර්සල් ආදිය අවශ්‍යතාවය අනුව ආරක්ෂක නිධාරීන් විසින් පරීක්ෂා නොකිරීම සහ මෙහි කුමන හෝ අවස්ථාවක කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකල ආකාරය දක්වමින් ආයතන ප්‍රධානියා විසින් යවනු ලබන නිවේදනයට එම නිවේදනය ලැබී වැඩ කරන දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්කරු විසින් ලිඛිත පිළිතුරක් ලබා නොදීම.

3. ලංසු සුරක්ෂණය ලංසු අයදුම්පත සමඟ රු. **250,000.00** වටිනා **2024.05.06** දින තෙක් වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණය ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ නමට ලබා දිය යුතු අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.
4. රුපියල් පන්දහසක (රු. 5,000.00) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් සහකාර පාලක (ප්‍රසම්පාදන), 5 වෙනි මහල B පර්යන්තය ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු **2024.01.03** දින සිට **2024.01.22** දක්වා කාල පරිච්ඡේදයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිල දී ගත හැක.
5. ලංසුකරුවන් විසින් ලංසුවේ මුල් පිටපත සහ අනුපිටපතක් සකස්කර එවා මුල්පිටපත සහ අනුපිටපත යනුවෙන් පැහැදිලිව ලකුණු කළ යුතුය. එම පිටපත් අතර කිසියම් වෙනසක් අනාවරණය වුවහොත් මුල්පිටපත වලංගු පිටපත වශයෙන් බලපැවැත්වේ.
6. ලංසු ලියවිලිවල නිලමුද්‍රාව තැබිය යුතු අතර, ලංසු බහාලන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "වැලිසර විදේශික රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම - 2024" ලෙස සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද ලංසු, ("මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් 2 කින් යුතුව වෙන වෙනම කවරවල බහා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, 5 වන මහල, B පර්යන්තය, ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට **2024.01.23** වැනි දින **ප.ව. 2.00**ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර එම ලංසු විවෘත නොකර ආපසු යැවීම සිදු කරනු ලැබේ.
7. **2024.01.23** වැනි දින ප.ව.2.**00**ට ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ නම් කරන ලද නියෝජිතයන්ට සහභාගි විය හැක.
8. විශේෂ අවස්ථාවන්හි දී ප්‍රසම්පාදන කමිටුවට සිය මනාපය පරිදි අතිරේක නිවේදනයක් නිකුත් කිරීමෙන් ලංසු ඉදිරිපත් කළ යුතු දිනය හා වේලාව දීර්ඝ කළ හැකිය.
9. ලංසු ඉදිරිපත් කළ යුතු අවසන් වේලාවට පසුව ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ඉදිරිපත් කළයුතු අවස්ථාවෙන් පසුව ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරන අතර ඒවා ලංසුකරුට නැවත භාරදේ.

INSPECTION ONLY

10. කොන්ත්‍රාත්තුවට අදාල ලංසුවේ මුල් පිටපත හා අනුපිටපත පැහැදිලිව යතුරුලේඛනය කොට හෝ අතින් ලියා එය අත්සන් කිරීමට නිසි බලය ඇති තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එය අත්සන් කළ යුතුය.
11. තෝරාගනු ලැබූ ලංසුකරුවකුගේ ලංසු සුරක්ෂණය ලංසු ප්‍රදානයෙන් පසුව එම ලංසුකරු විසින් කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නිදහස් කළ හැක.
12. ලංසු කරුවකු විසින් සිය ලංසුව, ලංසුව වලංගුව පවත්නා කාළ සීමාව තුළ ඉල්ලා අස්කරගනු ලැබුවහොත් හෝ තෝරාගනු ලැබූ ලංසුකරුවකු විසින් නියමිත කාලසීමාව තුළ සේවා සැපයීමට අපොහොසත් වුවහොත් එම ආයතනයට ලංසු ප්‍රදානය කරනු නොලැබේ.
13. ලංසුකරුවකු විසින් සිය ලංසුව පිළියෙල කිරීමේ දී හෝ අන්‍යාකාරයෙන් සිදු කරනු ලබන වියදම් වෙනුවෙන් ගෙවීම් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටත් නොවනු ඇත.
14. කිසියම් ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ හේතු කිසිවක් නොදන්වා සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.
15. ඉදිරිපත් කර ඇති ලංසු අයදුම්පත් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඔවුන්ගේ නිර්දේශය සඳහා යොමු කරන අතර, අනතුරුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සාර්ථක අයදුම්කරු තෝරාගනු ඇත.
16. තෝරාගත් ලංසුකරුට වලංගු කාලසීමාව තුළ ලංසුව පිළිගත් බව දැනුම් දෙනු ලැබේ.
17. සාර්ථක ලංසුකරු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර දින 10ක් ඇතුළත 4.2 හි ආකෘතියේ පරිදි කාර්ය සාධන සුරක්ෂණයක් පිළිගත් ලංසු වටිනාකමින් 10% ක වටිනාකමකට ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ නමට ලබා දිය යුතු අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.
18. ඉදිරිපත් කළ යුතු අතර දින 14ක් ඇතුළත දෙපාර්ශවය විසින් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ යුතුය.
19. ආගමන හා විගමන පාලක ජනරාල් වරයාගේ අවසරය නොමැතිව ලංසුව වෙනත් කෙනෙකුට පැවරීම හෝ බද්දට දීම තහනම් වේ.
20. මෙම ලංසු ලියවිල්ලට යාකර ඇති සියළුම ආකෘති පත්‍ර මඟින් ඉල්ලා ඇති තොරතුරු ලංසුකරු විසින් නිවැරදිව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු වන්නේය.
21. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති රීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.
22. උක්ත කොන්දේසි සහ නියමයන් කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව මම/අපි මෙහි අත්සන් කළෙමි/කළෙමු.

………............................................
ලංසුකරුගේ අත්සන

නිල මුද්‍රාව ........................................

දිනය ........................................

INSPECTION ONLY

**1.2 ආරක්ෂක සේවා යෙදවුම් උපලේඛනය**

| තනතුරු නාමය | දිවා සේවා මුරය | රාත්‍රී සේවා මුරය | දිනකට අවශ්‍ය මුළු ගණන |
|---|---|---|---|
| ස්ථානභාර ආරක්ෂක නිලධාරි | 1 | 1 | 2 |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි රහිත | 11 | 11 | 22 |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි සහිත | 2 | 2 | 4 |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (කාන්තා) | 2* | 2* | 4 |

* කාන්තා රෑඳවියන් රෝහල් ගත කරන අවස්ථා වලදී පමණක් අමතර කාන්තා නිලධාරීන් දෙදෙනෙකු රෝහල් වාට්ටුව තුළ නේවාසික රාජකාරී වල යෙදවිය යුතුය.

INSPECTION ONLY

**2 කොටස**

**2.1 ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම**

**ලංසු ආකෘති පත්‍රය**

(මෙහි සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී ලංසුවට ඇමුණුමක් ලෙස අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න)

1. ඉල්ලුම්කරුගේ නම: ..........................................................................................

2. ආයතනයේ නම: ..........................................................................................

3. ලිපිනය සහ දුරකථන අංකය: ..........................................................................................

4. ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දිනය : ..........................................................................................

5. ව්‍යාපාරයේ ස්වභාවය (තනි පුද්ගල/හවුල් ව්‍යාපාර/සීමිත සමාගම්) : ...................................

6. ව්‍යාපාරයේ ලියා පදිංචි අංකය හා දිනය: ..........................................................................................

7. හිමිකරුවන්ගේ/අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපිනයන්

| | නම | ලිපිනය |
|---|---|---|
| I. | .................................................. | .......................................................... |
| II. | .................................................. | .......................................................... |
| III. | .................................................. | .......................................................... |
| IV. | .................................................. | .......................................................... |
| V. | .................................................. | .......................................................... |

8. ආයතනයේ ආරක්ෂක කළමණාකරුගේ නම හා ලිපිනය :
…..........................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

9. ආයතනයේ සේවයේ නියුක්ත කිරීමට බලාපොරොත්තුවන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - (ආරක්ෂක අධීක්ෂණ නිලධාරීන් හා ආරක්ෂක නිලධාරීන් පිළිබඳව)

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

10. ආදායම් බදු ලිපිගොනුවේ අංකය: ..........................................................................................



INSPECTION ONLY

(පසුගිය වර්ෂ 3 සඳහා ගෙවීම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය)

11. එකතු කළ අගය මත බදු අංකය: ..........................................................................................
(පසුගිය වර්ෂයේ ගෙවීම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය)

12. සේවක අර්ථසාධක අරමුදල් අංකය: ..........................................................................................
සේවක භාරකාර අරමුදල් අංකය: ..........................................................................................
(ඉහත ගෙවීම් සනාථ කිරීම සඳහා පසුගිය මාස 12ක ගෙවීම් සහතික හා ලේඛණ ඉදිරිපත් කළ යුතුය)

13. ආයතනයේ මූල්‍යමය හැකියාව සනාථ කරන ලේඛණ ඉදරිපත් කර තිබේ ද යන වග:
........................................................................................................................................
(පසුගිය වර්ෂ 3ක විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය)

14. සේවා සැපයීම සඳහා මාසිකව ඉල්ලුම් කරන මුළු මුදල

| කාලය | බදු රහිත (රුපියල්) | බදු සහිත (රුපියල්) |
|---|---|---|
| සම්පූර්ණ මාසික මුදල | | |
| සම්පූර්ණ වාර්ෂික මුදල | | |

15. ආයතනය විසින් දැනට සේවා සපයනු ලබන ආයතන පිළිබඳ විස්තර

| සේවා සපයනු ලබන ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංකය | වාර්ෂික මුදල (රු.) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

16. ආරක්ෂක නිලධාරීන්ගේ පුහුණු මට්ටම පිළිබඳ කෙටි විස්තරයක්
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

17. නිල ඇඳුම් සකස් කර ඇත්තේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක අත් පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූලව ද යන වග
..................................................................
18. ගිනි අවි භාවිතයට ලබා ඇති අවසරපත් විස්තර ..................................................................

INSPECTION ONLY

## 3 කොටස

### 3.1. පිරිවැය වාර්තාව

**(ආ) සතියේ දින 07 (මසකට අදාල සෑම දිනකම එනම් දින 30 ට අදාලව පැය 12 ක කාලයක් සඳහා අතිකාල පැය 3 ක් ද සමඟ)- පෙ.ව. 7.00 සිට ප.ව. 7.00 දක්වා හා ප.ව 7.00 සිට පෙ.ව 7.00 දක්වා රාජකාරි සේවා මුරය**

| නිලධාරි කණ්ඩායම | අවශ්‍ය නිලධාරි ගණන | | | පැය 12 ක සේවා මුරයක් සඳහා ගාස්තුව (පෙ.ව 7.00 සිට ප.ව 7.00 දක්වා හෝ ප.ව 7.00 සිට පෙ.ව 7.00 දක්වා) | එක් දිනකට සේවා මුර සඳහා ගෙවන මුදල(රු.) බදු රහිත | එක් නිලධාරියෙක් සඳහා මසකට ගෙවන මුදල (රු.) බදු රහිත | එක් නිලධාරියෙක් සඳහා මාසික මුළු වියදම් එකතුව බදු සහිත (රු.) | නිලධාරීන් සියළුදෙනා සඳහා මාසික මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|
| | දිවා | රාත්‍රි | එකතුව | | | | | |
| ස්ථානභාර ආරක්ෂක නිලධාරි (පිරිමි) | 01 | 01 | 02 | | | | | |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි රහිත | 11 | 11 | 22 | | | | | |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි සහිත | 02 | 02 | 04 | | | | | |
| කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (කාන්තා) | 02 | 02 | 04 | | | | | |
| මුළු මුදල (රු.) | | | | | | | | |

INSPECTION ONLY

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් මාසික මුදල බදු රහිතව (අකුරින්) රුපියල් ....................................මෙම ටෙන්ඩරය අප ආයතනයට පිරිනැමුවහොත් ටෙන්ඩර් කොන්දේසිවලට අදාලව ඉහත දක්වා ඇති නිලධාරි සංඛ්‍යාව සේවයේ යොදවා ඔබ ආයතනයට කාර්යක්ෂම සේවාවක් සැපයීමට පොරොන්දු වෙමි.

..................................................
ලංසුකරුගේ අත්සන

නම: ......................................................

නිල මුද්‍රාව:...........................................

දිනය: ............................

**සාක්ෂිකරුවන්:**

1. අත්සන: ......................................
   නම: ...........................................
   ජා.හැ.අ. ......................................
   ලිපිනය:

2. අත්සන: ..............................................
   නම: ...................................................
   ජා.හැ.අ. ..............................................
   ලිපිනය:

**3.2 මාසික වේතනයේ ප්‍රමාණය**

| අනු අංකය | විස්තරය | ස්ථානභාර නිලධාරි | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි රහිත | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (පිරිමි) අවි සහිත | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි (කාන්තා) |
|---|---|---|---|---|---|
| 01 | ගෙවනු ලබන මාසික වේතනය | | | | |
| 02 | එක් දිනක් සඳහා සාමාන්‍ය කාලවේලාව (පළමු පැය 09) සඳහා ගෙවනු ලබන වේතනය | | | | |
| 03 | අතිකාල පැය 01ක් සඳහා ගෙවනු ලබන ප්‍රමාණය | | | | |
| 04 | සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා අදාළ කරගනු | | | | |

INSPECTION ONLY

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලබන මාසික ගෙවීම | | | | |

.................................

අයදුම්කරුගේ අත්සන

(රබර් මුද්‍රාව)

**3.3 ලංසුවට අදාල කොන්දේසි හා උපදෙස් අනුගමනය කරන බවට වන ලංසු අයදුම්කරුගේ ප්‍රකාශය (ලංසුකරු විසින් ලංසු අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය)**

INSPECTION ONLY

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවාව සැපයීම සඳහා සේවා ආයතනය වෙනුවෙන් ලංසු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන මම, මෙම ආරක්ෂක සේවාව සැපයීමට අදාළ ලංසු අයදුම්පතේ සඳහන් සියළු උපදෙස් හා කොන්දේසි වලට අතිරේකව මෙහි පහත දැක්වෙන සියළු කරුණුවලට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට එකඟ වන බව හා බැඳී සිටින බව මෙයින් ප්‍රකාශ කරමි. එයට අනුකූලව ද ආරක්ෂක සේවාව සැපයීමට එකඟ වෙමි. ඊට අනුකූල නොවන අයුරින් කටයුතු කිරීම යටත් කිරීම හෝ ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව දනිමි.

1. ලංසු ඉදිරිපත් කරනු ලබන්නේ පෞද්ගලික සමාගමක් වන අවස්ථාවක එම සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සහ කොටස් හිමිකරුවන්ගේ නම් හා පෞද්ගලික ලිපිනයන් ආගමන විගමන පාලක ජනරාල් වෙත දැන්විය යුතු බව,
2. සේවයේ අවශ්‍යතාව මත ස්ථානභාර නිලධාරින් හා ආරක්ෂක නිලධාරීන් ද දිනපතා සේවයේ යෙදවිය යුතු බව, හා පහත දක්වා ඇති කරුණු සම්බන්ධව විශේෂ අවධානය යොමු කල යුතු බව,

   i. මධ්‍යස්ථානයේ පිටත හා ඇතුලත පරිශ්‍රයේ නිලධාරීන්ගේ හා රැඳවියන්ගේ ආරක්ෂාව සැපයීම හා ඒ සඳහා පැය 24 පුරාම අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් විධිමත්ව ස්ථානගත කිරීම සිදුකල යුතුය.

   ii. මධ්‍යස්ථානයේ ඇති සියළු දේපල වල ආරක්ෂාව තහවුරු කිරීම සිදුකල යුතුය.

   iii. මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුතු ආගමන හා විගමන නිලධාරීන්ගේ අවසරයකින් තොරව කිසිදු උපකරණයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් රැඳවියන් වෙත ලබාදීම හෝ කිසිදු බාහිර පාර්ශවයකට ලබා දීමට ඉඩ ලබා නොදිය යුතුය.

   iv. රැඳවියන් මධ්‍යස්ථානයට ඇතුළු කිරීමේදී ඔවුන්ගේ දේහ පරීක්ෂාව හා ඔවුන් රැගෙන එන බඩු භාණ්ඩ හෝ නිසි අවසරයකින් රැගෙන එන භාණ්ඩ පරීක්ෂා කිරීම සහ මුදල්, වටිනා භාණ්ඩ, මත්ද්‍රව්‍ය, ජංගම දුරකථන, පරිගණක හෝ වෙනත් සන්නිවේදන උපකරණ මධ්‍යස්ථානයේ හෝ රැඳවියන්ගේ ආරක්ෂාවට තර්ජනය විය හැකි වෙනත් උපකරණ හා භාණ්ඩ ඇත්නම් ඒවා රඳවා ගැනීම සිදු කල යුතුය.

   v. පරීක්ෂාවෙන් පසු රැඳවියා සහ ඉහත රඳවාගත් උපකරණ හා භාණ්ඩ මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුතු ආගමන හා විගමන නිලධාරීන් වෙත විධිමත්ව භාරදීම සිදුකල යුතුය.

   vi. රැඳවියන් කඳවුර තුලදී හෝ කඳවුරෙන් පිටතට රැගෙන යාමේදී හෝ මධ්‍යස්ථානයෙන් පිටත රඳවා තබන අවස්ථාවලදී (රැඳවියන් රෝහල්ගත කරන අවස්ථාවලදී) හෝ අත්අඩංගුවෙන් පලායාමට නොහැකි වන ලෙස ආරක්ෂාව සැපයීම සිදුකල යුතුය.

vii. මධ්‍යස්ථානය තුළට කිසිදු බාහිර පුද්ගලයෙකුට ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය. විශේෂ හේතුවක් මත මධ්‍යස්ථානයට ඇතුළු වන්නේ නම් ඒ බව කාර්යභාර ආගමන හා විගමන නිලධාරියාට දන්වා අවසර ලබා ගැනීම කල යුතුය. එසේ ඇතුළු වන සියලු බාහිර පාර්ශවයන් හා වාහන පිළිබඳ විස්තර තබා ගත යුතුය.

viii. මධ්‍යස්ථානය තුල සහ පිටතදී රැඳවියන්ට ලබාදිය යුතු ආරක්ෂාව තක්සේරු කිරීමෙන් අනතුරුව අවශ්‍යතාවය අනුව අවි ආයුධ දැරීම තීරණය කල යුතුය.

ix. දිනපතා උදේ, සවස සහ විශේෂ අවස්ථාවන්හිදී මධ්‍යස්ථානයේ සිටින රැඳවියන් ආගමන හා විගමන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ගණනය කර සියළු රැඳවියන් සංඛ්‍යාව තහවුරු කරගැනීම සහ රැඳවියන්ගේ ලේඛනයට අනුව මධ්‍යස්ථානයේ සිටිය යුතු රැඳවියන් ඇති/නැති බව තහවුරු කර ගැනීම සිදුකල යුතුය.

x. මධ්‍යස්ථානයට රැගෙන එන හා නිදහස්වී යන රැඳවියන් පිළිබඳව තොරතුරු නිවැරදිව හා විධිමත්ව පවත්වාගෙන යායුතුය.

xi. ආහාර බෙදාදීම හා සෑම අවස්ථාවකදීම රැඳවියන් අතර සාමය පවත්වා ගැනීම හා සුපරීක්ෂාකාරීව සිටීම සිදුකල යුතුය.

xii. මධ්‍යස්ථානය තුල කලහකාරී සිදුවීමක්, ජීවිත හෝ දේපළ හානියක් හෝ වෙනත් නීතිය කඩකිරීමක් සිදුවීමේ අවදානමක් ඇත්නම් ඒ බව වහාම මධ්‍යස්ථානය භාර ආගමන හා විගමන නිලධාරියාට හෝ ස්ථානභාර ආගමන හා විගමන නිලධාරියාට හෝ මධ්‍යස්ථානය භාර ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරියාට, සහකාර පාලක හෝ නියෝජ්‍ය පාලක වෙත වහාම දැනුම්දීම සිදු කල යුතුය.

xiii. ආරක්ෂක සේවාවට අයත් නොවන පුද්ගලයින් රදවා තබා ගැනීම හා එවැනි පුද්ගලයින්ට නවාතැන් පහසුකම් සැපයීම සිදු නොකළ යුතුය.

xiv. ව්‍යවස්ථාපිත වැටුප්, දීමනා, අමතර ගෙවීම්, දායක මුදල් (EPF, ETF) වාර්තා මාසිකව ඉදිරිපත් කළ යුතුය.

xv. දෙපාර්තමේන්තුවේ නිසි අවසරයකින් තොරව රැඳවියන් පිටතට රැගෙන යාම සිදු නොකළ යුතුය.

xvi. රැඳවියන් හට අවසර ලබාදුන් භාණ්ඩ හා සේවා හැර වෙනත් සේවා හා භාණ්ඩ ලබාදීම හා එසේ කිරීමට ආධාර හා උපකාර ලබාදීම සිදු නොකළ යුතුය.

xvii. ආරක්ෂක නිලධාරීන් විසින් භාවිත කරනු ලබන ගිනි අවි ආරක්ෂිතව ගබඩාකළ යුතුය.

3.

i. ආරක්ෂක සේවා සපයන ආයතනය විසින් ආරක්ෂක නිලධාරින් දිනපතා සේවයට පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට ලේඛනයක් ස්ථානභාර නිලධාරි විසින් පවත්වාගෙන යා යුතු බව හා එය දිනපතා බලයලත් නිලධාරියාගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතු බව.

ii. තව ද, එම මාසය තුළ සේවය කරන ලද සේවකයින්ගේ මුළු සේවා දින ගණන ඇතුළත් වන පරිදි ලේඛනයක් (චෙක් රෝල්) ස්ථානභාර නිලධාරි විසින් පවත්වාගෙන යා යුතු බව හා මාසික බිල්පතක් ඉදිරිපත් කිරීමේ දී එම විස්තර ඇතුළත් වාර්තාවක් ද බිල්පතට අමුණා එවිය යුතු බව.

iii. එම ලේඛනය හා නියමිත දින සේවයේ නියුතු නිලධාරින්, නියමිත සේවා ස්ථානයන්හි සේවයේ යෙදී ඇද්ද යන්න පරීක්ෂා කර බැලීමට ආගමන හා විගමන පාලක ජනරාල්ට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට බලය ඇති බව.

4. වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය තුළ ආරක්ෂක සේවාව පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුට තමාගේ බඩු බාහිරාදිය ගබඩා කර තැබීමට යම්කිසි ස්ථානයක් නොහොත් කාමරයක් සපයන ලද්දේ නම්,

INSPECTION ONLY

ඊට සපයනු ලබන විදුලි බලය, ජලය හා ගෑස් යන මේවායේ වියදම වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරන විටක දී නිශ්චිත මුදලක් මාසිකව ගෙවිය යුතු බව.

5. කොන්ත්‍රාත්තුව අවසන් වූ පසුව කිසිම ගැටළුවකින් තොරව එම දේපළයන්හි භුක්තිය ආපසු ආගමන විගමන පාලක ජනරාල් වෙත භාරදිය යුතු බව හා ඕනෑම අවස්ථාවක ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරුට එබඳු ස්ථානයකින් ඉවත් වන ලෙස නියම කිරීමට ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇති බව,
6. එම කොන්ත්‍රාත්තුව යටතේ ඉටුවිය යුතු සේවය ඉෂ්ඨ කිරීමට ආරක්ෂක සේවා සැපයීම් කොන්ත්‍රාත්කරුට මොනයම් හේතුවක් නිසා හෝ නොහැකි වුවහොත් වෙනත් ආයතනයකින් එම සේවාව ඉටු කරවා ගැනීමට, විධිවිධාන යෙදීමෙන් ආණ්ඩුවට දරන්නට සිදුවන්නා වූ යම් අතිරේක වියදමක් වේ නම් එම මුදල ආරක්ෂක සේවා සැපයීමේ ආයතනයෙන් අයකර ගැනීමට ද ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇති බව.
7. ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ ආණ්ඩුවට ගෙවිය යුතු සියළුම මුදල්, ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරුට ගෙවන්නට තිබෙන ආරක්ෂක සේවා සැපයීමේ ගාස්තු මාසික බිල්පතෙන් අඩුකර ගැනීමට ආගමන විගමන පාලක ජනරාල් වෙත නීති ප්‍රකාරව බලය ඇති බව.
8. කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ තම අයිතිවාසිකම් වෙන කිසිම කෙනෙකුට පැවරීම හෝ අතුරු බද්දක් වශයෙන් දීම හෝ නොකළ යුතු බව, ආරක්ෂක සේවා සැපයීමේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක සේවය නතර කිරීම, නැවත ලංසු කැඳවීම හෝ වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ආගමන විගමන පාලක ජනරාල්ට බලය ඇති බව හා ආරක්ෂක සේවා සැපයීම් කොන්ත්‍රාත්කරු විසින් තම සේවය ඉල්ලා අස්කර ගන්නේ නම් මාස තුනක කාලයකට ප්‍රථම ඒ බව ආයතන ප්‍රධානියා මඟින් ආගමන විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතු බව.
9. ආරක්ෂක සේවාවේ යොදවනු ලබන එක් එක් සේවකයාගේ ඡායාරූපය, නම සහ අත්සන ඇතුළත් හැඳුනුම්පතක් පැහැදිලිව පෙනෙන සේ නිල ඇඳුමේ උඩුකය කොටසේ පැලඳීම සඳහා සියළුම සේවකයන්ට ලබාදීමට ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කළ යුතු බව හා ආරක්ෂක සේවාව සැපයීමේ යොදවන අයගේ නම්, ලිපිනයන් සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඔවුන් සේවයේ යෙදවීමට පෙර ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් විසින් නම් කළ නිලධාරියෙකු වෙත භාරදිය යුතු බව
10. තව ද, තමාගේ කවර හෝ සේවකයකු විසින් කම්කරු ආඥාපනත යටතේ හෝ එහි යම්කිසි ව්‍යවස්ථාපිත සංශෝධන, නොහොත් වෙනස් කිරීම් යටතේ හෝ කරනු ලබන ඕනෑම වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු වගකිව යුතු බව, ඒ සම්බන්ධ කිසිම වගකීමකට ආගමන විගමන දෙපාර්තමේන්තුව බැඳී නොසිටින බව.
11. ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු වෙනත් රෙගුලාසි ආගමන හා විගමන පාලක ජනරාල් විසින් වරින්වර නිකුත් කිරීමේ දී ඒවාට එකඟ වන බව.
12. ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස ආරක්ෂක සේවා සැපයීමේ ආයතනය නමින් තෝරා ගන්නා ස්ථානය වන ..................................................................................................................................... ........................................................................... (ආයතනයේ නම හා ලිපිනය) යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවුවහොත් ඒවා ඔහුට විධිමත් වූ පරිදි භාරදුන්නා සේ සලකන බව. ආරක්ෂක සේවා සැපයීමේ ආයතනයේ ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැන්විය යුතු බව. (කොන්ත්‍රාත් කාල සීමාව තුළ කොන්ත්‍රාත් ආයතනයේ නම වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.)
13. ආරක්ෂක සේවා සැපයීම් සේවාවේ කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම, ඔවුනට වැටුප් ගෙවීම, අතිකාල දීමනා ගෙවීම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීම ආදී සියළුම වගකීම් කම්කරු නීතිරීති වලට අනුකූලව සිදු කිරීමේ වගකීම කොන්ත්‍රාත්කරු වෙත පැවරෙන බව හා ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත නොපැවරෙන බව.

INSPECTION ONLY

14. ආරක්ෂක සේවා සැපයීමේ ආයතනය මඟින් ආරක්ෂක සේවා සැපයීම සඳහා යොදවන කාර්ය මණ්ඩලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ආචාරශීලීව හා විනය ගරුකව කටයුතු කළ යුතු බව.
15. ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට ආරක්ෂක සේවා සැපයීම් ආයතනය විසින් ඒ බව ලිඛිත හෝ වාචිකව ආගමන හා විගමන පාලක ජනරාල් වෙත හෝ බලය පවරා ඇති නිලධාරියෙකුට දැන්විය යුතු බව.
16. ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද ලංසු කොන්දේසි පත්‍රිකාවේ සඳහන් සියළුම කරුණු මෙම ගිවිසුමේ අවශ්‍යතාවය සඳහා කොන්ත්‍රාත් කොන්දේසි ලෙස සලකනු ඇති බව.
17. කෙසේ වෙතත් එකී ලංසු කොන්දේසි පත්‍රිකාවේ සඳහන් යම් වගන්තියක් මෙම ගිවිසුමේ අනිකුත් යම් වගන්ති හෝ වගන්තියක් සමඟ ගැටෙන්නේ නම්, එකී වගන්තිවලින් බලාත්මක වගන්තිය කුමක් ද යන්න තීරණය කිරීමේ බලය ආගමන හා විගමන පාලක ජනරාල් සතු බව
18. ආරක්ෂක නිලධාරීන් විසින් භාවිත කරනු ලබන ආයුධ හා ඒවා පරිහරණය කිරීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යංශයේ නිසි අවසරයක් ලබා තිබිය යුතු අතර, එය තහවුරු කිරීමට අදාළ ලේඛණ ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම, ආයතනය සතු ගිනි අවි සම්බන්ධ විස්තර(ගිනි අවි අංකය හා වර්ගය), ගිනි අවි භාවිතයට ලබා ඇති අවසරපත(ආයතන/පෞද්ගලිකව) හා එහි වලංගුතාවය, ආරක්ෂක නිලධාරීන් ගිනි අවි භාවිතයට ලබා ඇති පුහුණුව හා පලපුරුද්ද සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුය.
19. පුද්ගල ජාවාරමට හෝ පුද්ගල වෙළෙඳාමට නීතියෙන් වරදකරු වූ කිසිම පුද්ගලයෙකු ආරක්ෂක සේවා සැපයීම සඳහා යොදු නොගත යුතුය.

ඉහත උපදෙස් හා කොන්දේසි වලට එකඟ වන බවට වර්ෂ 2024.......... ක් වූ ....................... මස .......... දින අත්සන් තබමි.

................................
ලංසුකරුගේ අත්සන
(රබර් මුද්‍රාව)

..............................................................................
(ලංසුකරුගේ නම)

සාක්ෂි:

1. අත්සන: .......................................
නම: ...........................................................
ජාතික හැඳුනුම්පත් අංකය: .......................................
ලිපිනය: ...................................................................................................

2. අත්සන: .......................................
නම: ...........................................................
ජාතික හැඳුනුම්පත් අංකය: .......................................
ලිපිනය: ...................................................................................................

INSPECTION ONLY

**3.4 ලංසු සුරක්ෂණ සහතිකය සඳහා ආකෘතිය**

මෙම බැංකු සුරක්ෂණ සහතිකය වරහන් තුල දැක්වෙන උපදෙස්වලට අනුකූලව පුරවන්න.

.......................................... නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම සහ නිකුත් කරන ශාඛාවේ/කාර්යාලයේ ලිපිනය
ප්‍රතිලාභියා: ........................................................................................ (ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් දී ඇති) සේව්‍යය/ගැනුම්කරුගේ නම සහ ලිපිනය
දිනය: ................................ (නිකුත් කරන නියෝජ්‍යායතනය දුන් දිනය)
ලංසු සුරක්ෂණ සහතිකයේ අංක: ...................................... (නිකුත් කරන නියෝජ්‍යායතනය දුන් අංකය)
මෙහි මින් මතුවට ලංසුකරු වශයෙන් හඳුන්වනු ලබන ………………................................................ .................................. විසින් (නිකුත් කිරීමේ නියෝජ්‍යත්වය විසින් ලංසුකරු / බද්ධ ව්‍යාපාරයක් නම් සියලු නිත්‍යානුකූල හවුල්කරුවන්ගේ නාම ලේඛනයක්)
(මෙහි මින් මතුවට ලංසුකරු වශයෙන් හඳුන්වනු ලබන) .......................................... දින දරණ ලංසු සඳහා ආරාධනය
අංක .................................................. (අංකය ඇතුලත් කරන්න) යනුවෙන් ක්‍රියාත්මක කිරීම/සැපයීම සඳහා වන ......................................................... (කොන්ත්‍රාත්තුවේ නම) නැමැති කොන්ත්‍රාත්තුවට අදාල ලංසුව ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව අප වෙත දැනුම් දී ඇත. තව ද, ඔබ විසින් පනවා ඇති කොන්දේසිවලට අනුව ලංසු සුරක්ෂණයක් සෑම ලංසුවක් සඳහාම තිබිය යුතු බව අපි දනිමු.

ලංසුකරුගේ ඉල්ලීම පරිදි, අපි ......................................................... ලංසුකරු විසින් පහත සඳහන්
(නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම)
කොන්දේසි පැහැර හැරීම් හේතු කොට ගෙන ලංසුවේ කොන්දේසි කඩ කර ඇති බවට ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ප්‍රකාශයක් සහිතව යොමු කරනු ලබන ඔබගේ ප්‍රථම ලිඛිත එන්තරවාසිය අප වෙත ලැබුණ විගස
.....................................................................(...........................................................)කට
(මුදල ඉලක්කමෙන්) (මුදල අකුරෙන්)
(අ) නිශ්චිත ලංසු වලංගු කාලය තුල ලංසුව ඉල්ලා අස්කර ගැනීම:
(ආ) ලංසු කැඳවීමේ ආරාධනාවෙහි අඩංගු (මෙහි මින් මතුවට ලංසුකරුවනට උපදෙස් යනුවෙන් හැඳින්වෙන) ලංසුකරුවන්ට උපදෙස් වලට අනුකූලව වැරදි නිවැරදි කිරීම් නොපිළි ගැනීම, හෝ
(ඇ) ලංසු වලංගු කාලය තුළ සේව්‍යයා/ගැනුම්කරු විසින් ලංසුව පිළිගෙන ඇති බවට දැනුම් දෙනු ලැබීමෙන් පසුව:

I. අවශ්‍ය වේ නම්, කොන්ත්‍රාත්තුව ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම
II. ලංසුකරුවනට උපදෙස් අනුකූලව කාර්යය සාධන සුරක්ෂණය සැපයීමට අපොහොසත්වීම ප්‍රතික්ෂේප කිරීමය.

මෙම සුරක්ෂණය (අ) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු වේ නම්, ලංසුකරු විසින් අත්සන් තබන ලද කොන්ත්‍රාත්තුවේ සහ ලංසුකරු විසින් ඔබට නිකුත් කර ඇති කාර්යය සාධන සුරක්ෂණ පත්‍රයේ පිටපත් අප වෙත ලැබීමෙන් පසු හෝ (ආ) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන්නේ නම් (i) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන බවට ලංසුකරුට ඔබ යවන දැන්වීමේ පිටපත ඔබ වෙත ලැබීමෙන් පසු, එනමින් පෙරට යෙදෙන අවස්ථාවේ අවලංගු වනු ඇත. නැතහොත් ................................ දින දක්වා මෙම සුරක්ෂණය බලාත්මකව පවතිනු ඇත. (දිනය සඳහන් කරන්න)

පසු කාලීනව මෙම සුරක්ෂණය යටතේ ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීමක් .............................. දිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලය වෙත ලැබිය යුතුය.

අධිකාරයලත් නියෝජිතයන්ගේ අත්සන / අත්සන්

**4 කොටස**

**4.1 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම**

මෙහි පහත "පළමු පාර්ශවය"යැයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වන (සම්පූර්ණ නම.................................................. ....... (ආගමන හා විගමන පාලක ජනරාල් පාඨයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ එම ධූරයට පත්වන අනුප්‍රාප්තිකයෙක් හෝ අනුප්‍රාප්තිකයෝ ද, ආගමන විගමන පාලක ජනරාල් විසින් බලය පැවරූ යම් නිලධාරියෙකු ද, ඒ පාඨයට සියළු දෙනාම ඇතුලත් වන්නාහ) යන අය එක් පක්ෂයකට ද,

මෙහි "දෙවන පාර්ශවය" යැයි කියනු ලබන

**(අ) පෞද්ගලික ව්‍යාපාරිකයින් සඳහා**

මින් මතු දෙවන පාර්ශවය යැයි කියනු ලබන (පෞද්ගලික ලිපිනය)................................................
.................................................................................................................................................
ලිපිනයේ පදිංචි ...........................................................................................(ආයතනයේ ලිපිනය)
ස්ථානයේ තම ව්‍යාපාරික කාර්යාලය පවත්වාගෙන යනු ලබන, .......................................................
............................................................(කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම) (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් එකී කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නමද, ඔහුගේ උරුමක්කාර,පොල්ම:කාර, අද්මිනිස්ත්‍රාසිකාරයන් ද, හවුල් අයිතිකාරයන් ද, අදහස් කෙරෙන අතර, එම පාඨයට ඒ සියළු දෙනාම ඇතුලත් වන්නාහ).

**(ආ) සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා**

මින් මතු දෙවන පාර්ශවය යැයි කියනු ලබන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව අංක ......................................යටතේ ලියාපදිංචි කරන ලද ........................................................ ......................................................................... (ආයතනයේ ලිපිනය) වූ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන (ආයතනයේ නම) ......................................................................................... (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර පත්වන අධ්‍යක්ෂවරු ද අදහස් කෙරෙන අතර, ඒ පාඨයට ඒ සියළු දෙනාම ඇතුලත් වන්නාහ) යන අය අනෙක් පාර්ශවයටද,

බැඳී එකී දෙපාර්ශවය අතරේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී වර්ෂ 20.... ක් වූ .................... මස .......... වන දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

ඉහත දෙවන පාර්ශවය යැයි කියනු ලබන ....................................................................... (කොන්ත්‍රාත්කරුගේ නම හෝ ආයතනයේ නම) පළමු පාර්ශවය යැයි කියනු ලබන "සුහුරුපාය", සුභූතිපුර පාර, බත්තරමුල්ල ලිපිනයෙහි වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා ඒ යටතේ ස්ථාපිත කර ඇති අනෙකුත් ආයතනවල ආරක්ෂක සේවා සැපයීම සඳහා ඒ වෙනුවෙන් ගිවිස ගත් කාලය තුළ, ලංසු ලේඛනයන්හි සඳහන් මිල ගණන් යටතේ ඉහත දෙවන පාර්ශවය විසින් ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් මෙහි පහත සඳහන් සියළු කොන්දේසිවලට යටත්ව ඉහත දෙවන පාර්ශවයේ සේවය ලබා ගැනීමට පළමුවන පාර්ශවය එකඟ වන ලද හෙයින් එම දෙපාර්ශවය පහත සඳහන් පරිදි පොරොන්දු හා ගිවිසුම්වලට එකඟ වන ලදි.

දෙවන පාර්ශවය විසින් ආරක්ෂක සේවාවන් අපේක්ෂිත අන්දමින් හා සතුටුදායක මට්ටමකින් පවත්වා ගෙන යාමට යටත්ව එම සේවාව සැපයීම වෙනුවෙන් දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කරන මිල

ගණන්වලට අනුව පළමු පාර්ශවය විසින් රු. ................................ ක මුදලක් (බදු රහිතව) දෙවන පාර්ශවය වෙත ගෙවීමට එකඟ වේ.

ඉහත සඳහන් ..........................දින සිට ....................... දින දක්වා වූ කාලය කොන්ත්‍රාත් ගිවිසුමේ කාල පරිච්ඡේදය වන අතර, ඒ දින සිට කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය දීර්ඝ නොකරනු ලැබුවහොත් හෝ සාධාරණ නීත්‍යානුකූල හේතු මත අවසන් කරනු ලැබුවහොත් මෙම දෙපාර්ශවයන් අතර ගිවිසුම අවසන් වූ සේ කටයුතු කිරීමට දෙපාර්ශවය බැඳී සිටී.

1. ඉහත දෙපාර්ශවය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිරීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් බල පැවැත්වෙන බවට ද,
2. මෙහි සඳහන් කොට ඇත්තා වූ කොන්දේසි වලින් ආවරණය නොවන කරුණක් වේ නම්, එය පළමු පාර්ශවයේ අභිමතය පරිදි තීරණය වන බවට ද,
3. දෙවන පාර්ශවය යටතේ සේවයේ යොදවන ලද සේවකයින් කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම නීතිරීතිවලට අනුකූලව සේවයේ යෙදවීමටද, ඔවුනට වැටුප, අතිකාල, නිවාඩු දින වැටුප්, පාරිතෝෂික, ප්‍රසූතිකාගාර, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල් දීමනා හා වෙනත් සියළුම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් පිළිබඳ කිසිම වගකීමකට පළමු පාර්ශවය බැඳී නොසිටින බවද,
4. ආරක්ෂක සේවා සැපයීම පරීක්ෂා කිරීමේ බලය පළමු පාර්ශවය සතුවන බව ද කලින් කලට සේවයේ අවශ්‍යතාවය මත දෙනු ලබන උපදෙස් හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට දෙවන පාර්ශවය බැඳී සිටින බවද,
5. ආරක්ෂක නිලධාරීන් විසින් භාවිත කරනු ලබන ආයුධ හා ඒවා පරිහරණය කිරීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යංශයේ නිසි අවසරයක් ලබා තිබිය යුතු අතර, එය තහවුරු කිරීමට අදාළ ලේඛණ ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම, ආයතනය සතු ගිනි අවි සම්බන්ධ විස්තර(ගිනි අවි අංකය හා වර්ගය), ගිනි අවි භාවිතයට ලබා ඇති අවසරපත(ආයතන/පෞද්ගලිකව) හා එහි වලංගුතාවය, ආරක්ෂක නිලධාරීන් ගිනි අවි භාවිතයට ලබා ඇති පුහුණුව හා පලපුරුද්ද සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුය.
6. පුද්ගල ජාවාරමට හෝ පුද්ගල වෙළෙඳාමට නීතියෙන් වරදකරු වූ කිසිම පුද්ගලයෙකු ආරක්ෂක සේවා සැපයීම සඳහා යොදු නොගත යුතුය.
7. සේවයේ අවශ්‍යතාව මත ස්ථාන භාර නිලධාරීන් හා ආරක්ෂක නිලධාරීන්ද දිනපතා සේවයේ යෙදවිය යුතු බව හා පහත දක්වා ඇති කරුණු සම්බන්ධව විශේෂ අවධානය යොමුකල යුතු බව,

i. මධ්‍යස්ථානයේ පිටත හා ඇතුලත පරිශ්‍රයේ නිලධාරීන්ගේ හා රැඳවියන්ගේ ආරක්ෂාව සැපයීම හා ඒ සඳහා පැය 24 පුරාම අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් විධිමත්ව ස්ථානගත කිරීම.

ii. මධ්‍යස්ථානයේ ඇති සියළු දේපල වල ආරක්ෂාව තහවුරු කිරීම.

iii. මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුතු ආගමන හා විගමන නිලධාරීන්ගේ අවසරයකින් තොරව කිසිදු උපකරණයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් රැඳවියන් වෙත ලබාදීම හෝ කිසිදු බාහිර පාර්ශවයකට ලබා දීමට ඉඩ ලබා නොදීම.

iv. රැඳවියන් මධ්‍යස්ථානයට ඇතුළු කිරීමේදී ඔවුන්ගේ දේහ පරීක්ෂාව හා ඔවුන් රැගෙන එන බඩු භාණ්ඩ හෝ නිසි අවසරයකින් රැගෙන එන භාණ්ඩ පරීක්ෂා කිරීම සහ මුදල්, වටිනා භාණ්ඩ, මත්ද්‍රව්‍ය, ජංගම දුරකථන, පරිගණක හෝ වෙනත් සන්නිවේදන උපකරණ මධ්‍යස්ථානයේ හෝ රැඳවියන්ගේ ආරක්ෂාවට තර්ජනය විය හැකි වෙනත් උපකරණ හා භාණ්ඩ ඇත්නම් ඒවා රඳවා ගැනීම.

v. පරීක්ෂාවෙන් පසු රැඳවියා සහ ඉහත රඳවාගත් උපකරණ හා භාණ්ඩ මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුතු ආගමන හා විගමන නිලධාරීන් වෙත විධිමත්ව භාරදීම.

INSPECTION ONLY

vi. රැඳවියන් කඳවුර තුලදී හෝ කඳවුරෙන් පිටතට රැගෙන යාමේදී හෝ මධ්‍යස්ථානයෙන් පිටත රඳවා තබන අවස්ථාවලදී (රැඳවියන් රෝහල්ගත කරන අවස්ථාවලදී) හෝ අත්අඩංගුවෙන් පලායාමට නොහැකි වන ලෙස ආරක්ෂාව සැපයීම.

vii. මධ්‍යස්ථානය තුළට කිසිදු බාහිර පුද්ගලයෙකුට ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය. විශේෂ හේතුවක් මත මධ්‍යස්ථානයට ඇතුළු වන්නේ නම් ඒ බව කාර්යභාර ආගමන හා විගමන නිලධාරියාට දන්වා අවසර ලබා ගැනීම කල යුතුය. එසේ ඇතුළු වන සියලු බාහිර පාර්ශවයන් හා වාහන පිළිබඳ විස්තර තබා ගැනීම.

viii. මධ්‍යස්ථානය තුල සහ පිටතදී රැඳවියන්ට ලබාදිය යුතු ආරක්ෂාව තක්සේරු කිරීමෙන් අනතුරුව අවශ්‍යතාවය අනුව අවි ආයුධ දැරීම.

ix. දිනපතා උදේ, සවස සහ විශේෂ අවස්ථාවන්හිදී මධ්‍යස්ථානයේ සිටින රැඳවියන් ආගමන හා විගමන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ගණනය කර සියළු රැඳවියන් සංඛ්‍යාව තහවුරු කරගැනීම සහ රැඳවියන්ගේ ලේඛනයට අනුව මධ්‍යස්ථානයේ සිටිය යුතු රැඳවියන් ඇති/නැති බව තහවුරු කර ගැනීම.

x. මධ්‍යස්ථානයට රැගෙන එන හා නිදහස්වී යන රැඳවියන් පිළිබඳව තොරතුරු නිවැරදිව හා විධිමත්ව පවත්වාගෙන යාම.

xi. ආහාර බෙදාදීම හා සෑම අවස්ථාවකදීම රැඳවියන් අතර සාමය පවත්වා ගැනීම හා සුපරීක්ෂාකාරීව සිටීම.

xii. මධ්‍යස්ථානය තුල කලහකාරී සිදුවීමක්, ජීවිත හෝ දේපළ හානියක් හෝ වෙනත් නීතිය කඩකිරීමක් සිදුවීමේ අවදානමක් ඇත්නම් ඒ බව වහාම මධ්‍යස්ථානය භාර ආගමන හා විගමන නිලධාරියාට හෝ ස්ථානභාර ආගමන හා විගමන නිලධාරියාට හෝ මධ්‍යස්ථානය භාර ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරියාට, සහකාර පාලක හෝ නියෝජ්‍ය පාලක වෙත වහාම දැනුම්දීම.

8. ඉහත සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොයෙදවීම, සේවයේ අසතුටුදායක බව හෝ වෙනත් පැමිණිල්ලක් විභාග කිරීමේ බලය පළමු පාර්ශවය සතු වන අතර ඒ සඳහා සුදුසු දඩ මුදලක් ලංසුකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බවද, ඒ දඩ මුදල ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටින බවද,

9. දෙවන පාර්ශවය හෝ ඔහුගේ සේවකයින්ගෙන් පළමු පාර්ශවයේ කිසියම් දේපලකට හෝ භාණ්ඩ හා උපකරණයකට සිදු වන්නා වූ අලාභයකට හෝ හානියකට යම් මුදලක් ගෙවීමට සිදු වේ නම්, එම මුදල දෙවන පාර්ශවය වෙත ගෙවීමට නියමිත මුදලින් අඩුකර ගැනීමට පළමු පාර්ශවය ට බලය ඇති බවට ද,

10. රැඳවුම් කඳවුරරෙන් රැඳවියෙකු පළාගියහොත් එක් රැඳවියෙකු සඳහා සේවා සපයන ආයතනයේ මාසික බිල්පතින් 5% ක මුදලක් අයකර ගැනීමට පළමු පාර්ශවයට බලය ඇති බව ද,

11. සේවා සැපයීම හා ඒ සම්බන්ධ තත්ත්වයන් දිගින් දිගටම අසතුටුදායක වේ නම් අදාල කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට පළමු පාර්ශවයට බලය ඇති බව ද, එසේම එයට යටත්වීමට දෙවන පාර්ශවය බැඳී සිටින බවද,

12. දෙවන පාර්ශවය ලංසුවේ වටිනාකමින් 10%ක් වූ මුදලක් ආගමන විගමන පාලක ජනරාල් නමින් පිළිගත් බැංකුවකින් ලබා ගත් බැංකු ඇපකරයක් මගින් තැන්පත් කළ යුතු අතර දෙවන පාර්ශවයේ සේවා ඉටු කිරීම අසතුටුදායක බව පළමු පාර්ශවයට පෙනී ගියහොත් හෝ දෙවන පාර්ශවය විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩ කර ඇති බව පෙනී ගියහොත් කාර්ය සාධන බැදුම්කරයේ හිමිකම අහිමි කිරීමට ද, තව ද කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ද පළමු පාර්ශවයට බලය ඇති බව සහ දෙවන පාර්ශවය එයට යටත් වන බව ද, එයට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බව ද,

INSPECTION ONLY

13. එසේම පහත දැක්වෙන කරුණු හා ආරක්ෂක සේවා සැපයීමේ සේවාවට අයහපත් ලෙස බලපාන වෙනත් කරුණක් අනුව කොන්ත්‍රාත්තුව කඩකිරීම සම්බන්ධයෙන් ගනු ලබන වෙනත් ප්‍රතිකර්මයකට අගතියක් නොවන අයුරින් කොන්ත්‍රාත්තුව මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ අවසන් කිරීමට පළමු පාර්ශවයට බලය ඇති බව ද,

i. ආරක්ෂක සේවාව සැපයීමට අයත් නොවන පුද්ගලයින් ආයතන තුළ අනවශ්‍ය ලෙස රඳවා ගැනීම.
ii. පැමිණීමේ ලේඛණය නියමිත ලෙස පවත්වාගෙන නොයාම
iii. පැමිණීමේ ලේඛණයේ ව්‍යාජ අත්සන් යෙදීම
iv. කොන්ත්‍රාත්තුව මගින් නියම කරන ලද සේවකයින් සංඛ්‍යාව සේවයේ නොයෙදීම
v. දෙවන පාර්ශවය වෙත භාරදී ඇති පළමු පාර්ශවය සතු දේපල හෝ කාර්යාලයීය ඉඩකඩ අනිසි ලෙස පරිහරණය කිරීම
vi. පළමු පාර්ශවයේ දේපලවලට අනිසි ලෙස හානි කිරීම
vii. කොන්ත්‍රාත් ගිවිසුමෙන් එකග වූ ඕනෑම කාර්යයක්, දෙනු ලබන උපදෙස් අනුව නොකිරීම
viii. දෙවන පාර්ශවයේ සේවකයින් පළමු පාර්ශවයේ කාර්ය මණ්ඩලය හා මහජනතාව සමග අනවශ්‍ය අර්බුද හෝ ගැටුම් ඇති කර ගැනීම
ix. ආරක්ෂක සේවාවට අයත් නොවන පුද්ගලයින් රදවා තබා ගැනීම හා එවැනි පුද්ගලයින්ට නවාතැන් පහසුකම් සැපයීම.
x. ව්‍යවස්ථාපිත වැටුප්, දීමනා, අමතර ගෙවීම්, දායක මුදල් (EPF, ETF) වාර්තා මාසිකව ඉදිරිපත් නොකිරීම.
xi. දෙපාර්තමේන්තුවේ නිසි අවසරයකින් තොරව රුඳවියන් පිටතට රැගෙන යාම.
xii. රුඳවියන් හට අවසර ලබාදුන් භාණ්ඩ හා සේවා හැර වෙනත් සේවා හා භාණ්ඩ ලබාදීම හා එසේ කිරීමට ආධාර හා උපකාර ලබාදීම.

14. නව කොන්ත්‍රාත්කරුවෙක් තෝරාගන්නා තෙක් අවශ්‍ය වන්නේ නම්, පළමු පාර්ශවයේ අවශ්‍යතාවය ඇතිව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට සේවයේ නියුතු දෙවන පාර්ශවයේ ගිවිසුමේ නියම කර ඇති කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීමට බලය ඇත. එසේ කොන්ත්‍රාත්තුව දීර්ඝ කොට, සේවයේ නිරත කරවනු ලබන දෙවන පාර්ශවය මෙම ගිවිසුමට අනුකූලව තම සේවා කටයුතු පවත්වාගෙන යාමට බැඳී සිටින බවද,
15. එසේම අංක 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත හෝ ඒ පිළිබඳව කුමන හෝ ව්‍යවස්ථාපිත සංශෝධන වෙනස් කිරීමක් හෝ සම්බන්ධයෙන් දෙවන පාර්ශවයේ කුමන හෝ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් කරනු ලබන හිමිකම්පෑමක් හෝ වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් පළමු පාර්ශවය විසින් වගකීමට බැඳී නොසිටින බවද,
16. ආරක්ෂක සේවා සැපයීම සඳහා නියමිත සම්පූර්ණ සේවක සංඛ්‍යාව සැපයීමට අපොහොසත් වන්නේ නම්, පහත සඳහන් පරිදි දඩ මුදල් අය කරනු ලබන බව හා එම මුදල් අදාල බිල්පතෙන් අය කර ගැනීමට පළමු පාර්ශවයට බලය ඇති බව ද,

i. දිනකට නියමිත සේවක සංඛ්‍යාවට වඩා අඩුවෙන් සපයන එක් සේවකයෙක් වෙනුවෙන් දිනකට වැටුප බැගින් අඩු කිරීම. (දිනක වැටුප යනු:- සියළු ව්‍යාස්ථාපිත දීමනා සහිත මාසික වැටුපෙන් 1/25ක්)
ii. ඉහත i ට අමතරව දිනකට නියමිත සේවක සංඛ්‍යාවට වඩා අඩුවෙන් සපයන එක් සේවකයෙකු වෙනුවෙන් රු.200.00 බැගින් අඩු කිරීම

17. එසේම ආරක්ෂක සේවා සැපයීමේ දී කොන්ත්‍රාත්කරුගේ නිලධාරීන් විසින් කරනු ලබන අධීක්ෂණ කටයුතුවලට අමතරව ආරක්ෂක සේවා රාජකාරී ඉටු කිරීම පිළිබඳව අවශ්‍ය යැයි අදහස් කරන ඕනෑම අවස්ථාවක දී පළමු පාර්ශවය විසින් අධීක්ෂණය කරනු ලබන බවද,
18. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට දෙවන පාර්ශවය යටත් වන බව ද,

INSPECTION ONLY

19. ආරක්ෂක සේවය සපයන ආයතනය විසින් ආරක්ෂක සේවාව සඳහා අනුයුක්ත කරනු ලබන සේවකයින්ගේ සහ ස්ථානභාර නිලධාරීන්ගේ දිනපතා සේවයට පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට ලේඛණයක් පවත්වාගෙන යා යුතු බව ද, එය දිනපතා දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීයාගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කල යුතු බව ද, තවද එම මාසය තුළ සේවය කරන ලද සේවකයින්ගේ මුළු සේවා දින ගණන ඇතුලත් වන පරිදි ලේඛණයක් (චෙක් රොල්) පවත්වාගෙන ආ යුතු බව ද, මාසික බිල්පත් ඉදිරිපත් කිරීමේ දී එම විස්තර ඇතුළත් වාර්තාවක් ද මාසික බිල්පතට අමුණා එවීමට දෙවන පාර්ශවය බැඳී සිටින බව ද,

20. දිනපතා එක් එක් සේවා වැඩ මුරය ආරම්භ කිරීමට ප්‍රථම එම වැඩ මුරය සඳහා එක් එක් ස්ථානයේ සේවයේ යොදවනු ලබන ආරක්ෂක සේවා කාර්ය මණ්ඩලයේ නම් ලැයිස්තුවක් ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිපාලන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු බව (ජාතික හැඳුනුම්පත් අංක ද සහිතව) පැමිණීමේ ලේඛණය හා නියමිත දින සේවයේ නියුතු ආරක්ෂක සේවා නිලධාරින් නියමිත සේවා ස්ථානයන්හි සේවයේ යෙදී ඇත්ද යන්න පරීක්ෂා කර බැලීමට පළමු පාර්ශවයට බලය ඇති බව ද,

21. දෙවන පාර්ශවය විසින් ඇප වශයෙන් තැන්පත් කරනු ලබන මුදල්වලට කිසිදු පොළියක් ගෙවනු නොලබන බව ද,

22. දෙවන පාර්ශවයට බඩු බාහිරාදිය ගබඩා කර තැබීමට යම්කිසි ස්ථානයක් නොහොත් කාමරයක් සපයන ලද්දේ නම්, පළමු පාර්ශවය විසින් තීරණය කරනු ලබන පරිදි ඒ සඳහා යම් කුලියක් ද, එසේ ම ඊට සපයනු ලබන විදුලි බලය, ජලය, ගෑස් යන මේවායේ වියදම් ද ඔහු දෙවන පාර්ශවය විසින් ගෙවිය යුතු බව සහ මෙම කොන්ත්‍රාත්තුව අවසන් වූ පසු කිසිදු ගැටළුවකින් තොරව එම දේපලවල භුක්තිය ආපසු පළමු පාර්ශවය වෙත භාරදිය යුතු බව ද, තවද මාසයකට කලින් දැන්වීමක් කර ඕනෑම අවස්ථාවක දෙවන පාර්ශවයට එබදු ස්ථානයකින් ඉවත් වන ලෙස නියම කිරීමට පළමු පාර්ශවයට බලය ඇති බවද,

23. එසේ ම මෙම කොන්ත්‍රාත්තුව යටතේ තමාගෙන් ඉටුවිය යුතු සේවය ඉෂ්ඨ කිරීමට දෙවන පාර්ශවයට මොනයම් හේතුවක් නිසා හෝ අපොහොසත් වුවහොත් වෙනත් ආයතනයකින් එම සේවාව ඉටු කර ගැනීමට විධිවිධාන යෙදීමට ද, එසේ විධි විධාන යෙදීමෙන් ආණ්ඩුවට දරන්නට සිදු වූ යම් අතිරේක වියදමක් වේ නම් ඒ වියදම ද දෙවන පාර්ශවයෙන් අයකර ගැනීමට පළමු පාර්ශවයට බලය ඇති බව සහ එම මුදල ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටින බව ද,

24. එසේම ආරක්ෂක සේවා සැපයීමේ කටයුතු අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක මාසයක දැනුම් දීමකින් සේවය නතර කිරීමට හා නැවත ලංසු කැඳවීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට දෙවන පාර්ශවයට බලය ඇති බව ද, දෙවන පාර්ශවය විසින් තම සේවය ඉල්ලා අස්කර ගන්නේ නම්, මාස තුනක කාලයකට ප්‍රථම ඒ බව පළමු පාර්ශවයට දැන්වීමට කොන්ත්‍රාත්කරු බැඳි සිටින බව ද,

25. ආරක්ෂක සේවාව සඳහා යොදවනු ලබන එක් එක් සේවකයාගේ ඡායාරූපය, නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය හා අත්සන ඇතුලත් හැඳුනුම්පතක් පැහැදිලිව පෙනෙන සේ නිල ඇඳුමේ උඩුකය කොටසේ පැළඳීම සඳහා අදාල සේවකයින්ට ලබා දීමට දෙවන පාර්ශවය කටයුතු කළ යුතු අතර එම හැඳුනුම්පත රාජකාරී වේලාව තුළ පැළඳ සිටිය යුතු බව ද, එසේම අදාළ නිලධාරින් හා සේවකයින් ආරක්ෂක සේවා සැපයීමේ යොදවන අයගේ නම්, ලිපිනයන් හා හැඳුනුම්පත් අංක පළමු පාර්ශවය වෙත කොන්ත්‍රාත්තුව භාර ගැනීමෙන් පසු භාරදිය යුතු බව ද,

26. ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු වෙනත් රෙගුලාසි පළමු පාර්ශවය ආගමන හා විගමන පාලක ජනරාල් විසින් වරින් වර නිකුත් කරනු ලබන බව ද,

27. දෙවන පාර්ශවය වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස දෙවන පාර්ශවය ලංසු ලියවිලිවල සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එම දැන්වීම් යොමු කළහොත් ඒවා ඔහුට විධිමත් ලෙස භාරදුන්නා ලෙස සලකනු ලබන බවද, එම ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම පළමු පාර්ශවයට දැන්වීමට දෙවන පාර්ශවය බැඳී සිටින බව ද,

28. ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට දෙවන පාර්ශවය විසින් ඒ බැව් ලිඛිතව හෝ වාචිකව පළමු පාර්ශවය වෙත දැන්විය යුතු බව ද,

INSPECTION ONLY

29. දෙවන පාර්ශවය විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද ලංසු කොන්දේසි පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු මෙම ගිවිසුමේ අවශ්‍යතාවය සඳහා ලංසු කුවිතාන්සියක් ලෙස සලකනු ලබන බව ද,

30. කෙසේ වෙතත් එකී ලංසු කොන්දේසි පත්‍රිකාවේ සඳහන් යම් වගන්තියක් මෙම ගිවිසුමේ අනෙකුත් යම් වගන්ති හෝ වගන්තියක් සමඟ ගැටෙන්නේ නම්, අදාල වන්නේ කුමක් ද යන්න තීරණය කිරීමේ බලය පළමු පාර්ශවය සතු වන බව ද,

31. මෙහි සඳහන් සියළුම වගන්තිවලින් ප්‍රකාශ වන කරුණු හා අදහස්වලට අනුකූලව කටයුතු කිරීමට එකඟව බැඳී සිටින බව ද,

32. දෙවන පාර්ශවය මෙම ලංසුව ප්‍රදානය කිරීමෙන් පසු වෙනත් කෙනෙකුට පැවරීම හෝ අතුරු බඳුදීම සපුරා තහනම් බව ද,

33. ගෙවීම් කරනු ලබන්නේ පවරා ඇති සෑම අංශයකම වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර තිබෙන බවට අදාල නිලධාරින් සහතික කිරීමෙන් පසුව හා දෙවන පාර්ශවය විසින් ගෙවීම් ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුව බව ද,

34. පළමු පාර්ශවය විසින් ඉල්ලා සිටිය හොත් ආරක්ෂක සේවාවේ නියුතු සේවකයින් හා ස්ථානභාර නිලධාරින් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතික හෝ පොලිස් නිෂ්කාශන සහතික ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශවය සූදානමින් සිටිය යුතු බව ද,

35. සේවයෙහි යෙදෙන ආරක්ෂක සේවා සැපයීමේ කාර්යය මණ්ඩලය තමන්ගේ වෙනත් අවශ්‍යතා සඳහා තම සේවා ස්ථානයෙන් බැහැරව යාමට සිදුවන අවස්ථාවල දී ඔවුන් මුදා හැරීමට පෙර එම ස්ථානවලට ආදේශක සේවකයින් යෙදවිය යුතු බව ද,

36. ආරක්ෂක සේවා සැපයීමේ සියළුම නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට සහ මහජනයාට අවාරශීලී විය යුතු අතර මනා විනයකින් යුක්ත විය යුතු බව ද

37. ගිවිසුම මඟින් සැපයීමට එකඟ වූ සේවා නොඅඩුව සහ පරිපූර්ණව සැපයිය යුතු බවට ද, ආරක්ෂක සේවා සැපයීමේ සේවා පරීක්ෂණ නිලධාරීන් සහ කම්කරුවන් සුදුසු ප්‍රසන්න නිල ඇඳුමකින් සැරසී සිටිය යුතු බවට ද, තම ආයතනයේ හැඳුනුම්පත පැළඳ සිටිය යුතු බව ද, ගිවිසුම මඟින් සැපයීමට එකඟ වූ සේවාව නොඅඩුව හා පරිපූර්ණව සැපයිය යුතු බවද, සේවයේ යොදවනු ලබන ආරක්ෂක සේවා නිලධාරීන්/ ස්ථානභාර නිලධාරීන් / සේවකයින් පූර්ණ නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතු බව ද, ඔවුන් සඳහා අවශ්‍ය නිල ඇඳුම්, විදුලි පන්දම්, උපකරණ, ලිපි ද්‍රව්‍ය හා වෙනත් අවශ්‍යතා දෙවන පාර්ශවය විසින් සැපයිය යුතු බව ද,

38. ආරක්ෂක සේවා සැපයීමේ සේවකයින් හා නිලධාරින් වයස අවුරුදු 18ට වඩා නොඅඩු හා 50ට වඩා නොවැඩි විය යුතු බවද,

39. එසේම ආරක්ෂක සේවාව සැපයිය යුතු ස්ථානය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ලංසු අයදුම්පතෙහි දක්වා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ආරක්ෂක සේවා සැපයීමේ නිලධාරින් සේවයේ යෙදවිය යුතු ස්ථානයක්/ස්ථාන වන බව ද,

40. සෑම මසකම 10 වන දිනට පෙර (පෙර මාසයේ) මාසික බිල්පත්, ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශවය බැඳී සිටින අතර, මෙකී දිනට පසුව ඉදිරිපත් කරනු ලබන බිල්පත් සම්බන්ධයෙන් ගෙවීම් ප්‍රමාද වීම මඟින් අලාභයක් වේ නම් එය දරා ගැනීමට දෙවන පාර්ශවය බැඳී සිටින බව ද,

41. තව ද, දෙවන පාර්ශවය පෞද්ගලික සමාගමක් නම්, එම සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන්/කොටස් හිමිකරුවන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත දැනුම්දිය යුතු අතර අදාල කොන්දේසිවලට අනුකූලව සේවා සැපයීමට එකඟ වන බව ද,

42. තව ද, සේවයේ අවශ්‍යතාව මත ආරක්ෂක සේවා සපයන සේවකයින් හා ස්ථානභාර නිලධාරීන් දිනපතා සේවයේ යෙදවිය යුතු අතර ලංසු පත්‍රිකාවේ සඳහන් කාල පරිච්ඡේදයන් තුළ එම සේවාවන් අඛණ්ඩව හා නොඅඩුව සම්පූර්ණ කිරීමට එකඟ වන බව ද ඒ සඳහා බැඳී සිටින බව ද, මෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව එම කාර්යයන් සපුරාලන බවට ද,

43. ඉහත කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් සියළු උපදෙස් හා කොන්දේසි කියවා තේරුම්ගෙන එම කොන්දේසි පරිපූර්ණව හා නොඅඩුව ඉටු කරන බවට එකඟව හා බැඳි දෙපාර්ශවය විසින් එයට

INSPECTION ONLY

බැඳී 2023 ......................... දින දී ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී අත්සන් තබන ලදි.

ආයතනයේ අයිතිකරු/අයිතිකරුවන් වෙනුවෙන්

සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන්
ආගමන විගමන පාලක ජනරාල් (නිල මුද්‍රාව)

**සාක්ෂි**

1. .............................................

2. .............................................

**සාක්ෂි**

1. .....................................................

2. .....................................................

INSPECTION ONLY

...........................................................................................(නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම)
............................................................................................(නිකුත් කරන ශාඛාවේ/කාර්යාලයේලිපිනය)
ප්‍රතිලාභියා : ...........................................................................(සේවායාගේ නම සහ ලිපිනය)
දිනය: .....................................................
කාර්ය සාධන සුරක්ෂණ අංකය: ..........................................................

මෙහි මින් මතුවට කොන්ත්‍රාත් වශයෙන් හඳුන්වනු ලබන ........................................................................................ (කොන්ත්‍රාත්කරුගේ / සැපයුම්කරුගේ නම) අංක …..................................... දරණ ........................... දිනැති කොන්ත්‍රාත්තුවේ ................................. (අංකය යොදන්න) .............................................................................................................. සඳහා (මෙහි මින්මතුවට "කොන්ත්‍රාත්තුව" [ඉදිකිරීම්/සැපයුම් සඳහන් කරන්න] යනුවෙන් හඳුන්වනු ලබන)
.......................................................................................................................................................
(කොන්ත්‍රාත්තුවේ නම සහ වැඩ ගැන කෙටි විස්තරයක් සඳහන් කරන්න) ඔබ ඇතුලත්ව වූ බව අපට දැනුම් දී ඇත.

තවදුරටත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූලව කාර්ය සාධන සුරක්ෂණයක් අවශ්‍ය බව අප දනිමු. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි අපි...........................................................................................(නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම) කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුකූලව කොන්ත්‍රාත්කරු බැඳීම් උල්ලංඝනය කර ඇති බවට ඔබ වෙතින් ලැබෙන ලිඛිත ප්‍රකාශය සහිත ප්‍රථම ලිඛිත ඉල්ලීම අප වෙත ලැබුණ පසු ඔබගේ ඉල්ලීම සනාථ කිරීමට හෝ සඳහා අවශ්‍යතාවයෙන් තොරව එහි සඳහන් ...............................................................................(මුදල ඉලක්කමෙන්)/(මුදල අකුරෙන් සඳහන් කරන්න) නොඉක්මවන ඕනෑම මුදල් 24පමාණයක් හෝ ප්‍රමාණයන් අහෝසි කර ඔබට ගෙවීම ට අපි භාර ගතිමු. එම මුදල කොන්ත්‍රාත් මුදල ගෙවිය යුතු මුදල් වර්ගයකින් සහ එම ව්‍යවහාරික මුදල්වල පරිවර්තිත වටිනාකමින් විය යුතුය.

මෙම සුරක්ෂණය අවම වශයෙන් ............................... දිනට අවසන් වනු ඇති අතර (කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28ක් සඳහන් කරන්න) ගෙවීම් සඳහා කරනු ලබන ඕනෑම ඉල්ලීමක් එදිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබිය යුතුය.

.....................................................
අත්සන